# පරිච්ඡේදයක අවසානය

තවත් ජනාධිපතිවරණයක් පමණක් නොවූ නිලවරණයක් අවසන් වී ඇත. මහින්ද රාජපක්ෂ මහතා අති විශිෂ්ට ජයග්‍රහණයක් අත්කරගෙන තවත් අවුරුදු හයක් සඳහා ජනාධිපති ලෙස කටයුතු කිරීමට වරම් ලබා ඇත. එහෙත් තවමත් ජනාධිපතිවරණය පිළිබඳ සියලු කටයුතු අවසන් යැයි කිව නො හැකි ය. සරත් ෆොන්සේකා ජනාධිපතිවරණයෙහි දී ජනතාව දී ඇති තීන්දුව නො පිළිගනියි. ඒකාධිපතිවාදී මනසක් ඇති ඔහු ජනතා තීන්දුවක් නොපිළිගැනීම පුදුමයට කරුණක් නො වේ. එහි දී ඔහුට ජ වි පෙරමුණේ ද සම්පූර්ණ සහාය ලැබෙනු ඇත. සරත් ෆොන්සේකාටත් ජ වි පෙටත් ජනතා තීන්දු යනු තම තමන්ගේ තීන්දු මිස අනෙකක් නො වේ. ජනාධිපතිවරණයේ දී විපක්ෂයට හා අනෙක් විජාතික බලවේගවලට (අනුර දිසානායකගේ දේශපාලන නායකත්වය යටතේ ජ වි පෙ ද දැන් විජාතික බලවේගයකි.) අරමුණු තුනක් විය. එකක් ඊනියා සාක්ෂි එකතු කරගනිමින් මහින්ද රාජපක්ෂ, ගෝඨාභය රාජපක්ෂ, ශවින්ද්‍ර සිල්වා, ප්‍රසන්න සිල්වා මහත්වරුන් ඇතුළු කිහිප දෙනකු යටත්විජිතවාදීන්ගේ යුද්ධාධිකරණ දංගෙඩියට යැවීම ය. දෙවැන්න ජ වි පෙ ඔස්සේ රටේ අවුල් ඇතිකර හැකිනම් මහින්ද රාජපක්ෂ මහතාගේ ජයග්‍රහණය වැළැක්වීම හා එසේ වැළැක්වීමට නොහැකි වුවහොත් රට අරාජික කිරීමට උත්සාහ කිරීම ය. ජ වි පෙ නායකයකු වූ විජිත හේරත් සහ පිරිසක් ඊනියා ඡන්ද මංකොල්ලයක් වැළැක්වීමට යැයි කියමින් ජනාධිපතිවරණය දිනයේ උතුර බලා ගියේ මෙහි එක් පියවරක් ලෙස බව පැහැදිලි ය. තුන්වැනි අරමුණ වූයේ සම්බන්ධන් මාර්ගයෙන් ඊනියා ස්වයංනිර්ණ අයිතිය ආදී නන්දිකඩාල් කලපුවේ දී මරා දමනු ලැබූ සංකල්ප නැවතත් ගොඩගැනීම හා ඒ ඔස්සේ දෙවැනි ප්‍රභාකරන් කෙනකු බිහිකිරීම ය.

ජනාධිපතිවරණය අවසන් වීමටත් පෙර සිනමන් ලේක්සයිඩ් (ට්‍රාන්ස් ඒෂියා) හෝටලයේ කාමර සියයකට පමණ ගිය සරත් ෆොන්සේකා රනිල් අනුර දිසානායක සම්බන්ධන් මංගල හකීම් ෆොන්සේකාගේ ඊනියා ආරක්ෂක භටයන්, පවුලේ උදවිය ආදිය මේ වන විට ඉන් පිටවී ගොස් ය. ඒ අතර සරත් ෆොන්සේකාගේ බ්‍රිතානි ජාතික නිලවරණ උපදේශකයා සිටියේ දැයි දැනගැනීමට නො හැකි ය. ඒ කෙසේ වෙතත් මේ හෝටල් කාමරවල සිට සරත් ෆොන්සේකා ලලිත් වීරතුංග මහතාට කතාකර තමාට දිවුරුම් දීමට කටයුතු කරන මෙන් ඉල්ලා ඇතැයි වාර්තා වෙයි. ඒ නිලවරණ ප්‍රතිඵල නිකුත්වීමට ද පෙර ය. නිලවරණයෙන් පරාජය වූ බව දැනගැනීමෙන් පසුව ඇමරිකන් තානාපති කාර්යාලයේ වාහන දෙකක් සරත් ෆොන්සේකා රැගෙන යෑමට පැමිණි බවත් හෝටලය වටා රැඳී සිටි ආරක්ෂක හමුදා එයට ඉඩ නොදුන් බවත් කියැවෙයි. නිලවරණයෙන් පසුවදා සරත් ෆොන්සේකාගේ පහර දීමකට ලක් වූයේ යැයි කියන මංගල ද රනිල් ඇතුලු අනෙක් පිරිස ද හෝටලයෙන් පිටත්ව ගොස් ඇති නමුත් හිටපු ජෙනරාල්වරයා හෝටලයේ ම රැඳී සිටිමින් ජනමතය වංචා කිරීම හා ආණ්ඩුවේ ඊනියා දූෂණ , තම ජීවිතයට ඇති තර්ජන ආදිය ගැන බටහිර ජනමාධ්‍යවලට ප්‍රකාශ කරමින් තව දුරටත් තම පළිගැනීමේ දේශපාලනයෙහි නිරත වී ඇත. අද ඔහුට රනිල් ඇතුලු පිරිස නැත. රනිල් ජනාධිපතිවරණය සාධාරණ බවට ප්‍රකාශයක් නිකුත් කර ඇත. සරත් ෆොන්සේකාගෙන් අද තවදුරටත් ප්‍රයෝජනයක් ඇත්තේ බටහිර යටත්විජිතවාදීන්ට හා ජ වි පෙට පමණ ය. බටහිරයන් මහින්ද රාජපක්ෂ මහතා ඇතුලු පිරිස දංගෙඩියට දැක්කීමට ෆොන්සේකා යොදාගනු ඇත. ජ වි පෙ සරත් ෆොන්සේකා හා ඔහුගේ ඊනියා ආරක්ෂක භටයන් සමග එක් වී කලබල ඇතිකර බලය ලබාගැනීමේ සැලැස්ම ක්‍රියාත්මක කරමින් සිටියි.

එහෙත් ජනතාව ඒ එකක්වත් සාර්ථක වීමට කිසිදු ඉඩක් තබා නැත. දහඅට ලක්ෂයකට වැඩි ඡන්ද සංඛ්‍යාවකින් මහින්ද රාජපක්ෂ මහතා ජයග්‍රහණය කර තිබිය දී ජ වි පෙ සෙල්ලම්වලට ජනතාවගෙන් ඉඩක් නො ලැබෙයි. අනුර දිසානායක, ටිල්වින්, සෝමවංස (සෝමහංස) විජිත හේරත් නායකත්වයට පින්සිදුවන්නට ජ වි පෙ මුලුමනින් ම මෙන් කඩා වැටී ඇත. ජ වි පෙ දැනටමත් තවත් ත්‍රිරෝද පක්ෂයක් බවට පත් වී ඇත. ජාතිකත්වයෙන් ඊනියා මාක්ස්වාදී ජාත්‍යන්තර දේශපාලයකට දෝලනය වූ ජ වි පෙට අද ලයනල් බෝපගේ ගේ ම පිහිට ය. ජ වි පෙරමුණේ වෛරී දේශපාලනයට තවදුරටත් මෙරට දේශපාලනයේ ඉඩක් නැත. මෙරට විශ්වවිද්‍යාලවලින් ද ජ වි පෙ මුලුමනින් ම අතුගෑවී යන දිනය වැඩි ඈතක නො වෙයි. අද කඩා වැටී ඇත්තේ විජාතික බලවේගයක් වූ ජ වි පෙ පමණක් නො වේ. අනෙක් විජාතික බලවේගවලට ද අද මෙරට දේශපාලනයෙහි තැනක් නැත. ඔවුන් පවත්වාගෙන යනු ලබන්නේ බටහිරයන්ගේ මුදලිනි. පසුගිය අවුරුදු සියයක පමණ කාලයක ජාතිකත්වය මෙතරම් ශක්තිමත් වූ කාල පරිච්ඡේදයක් තිබී නැත. පනස්හයේ දී පවා ජාතිකත්වයට බලයක් තිබුණේ සුළු කාලයකට පමණ ය. පනස්නවයේ දී බණ්ඩාරනායක මහතා ඝාතනය කරනු ලැබිණි. එහෙත් දෙදහස් පහේ දී බලයට පත් වූ ජාතික බලවේග දෙදදහස් දහයේ දී තවත් ශක්තිමත් වී ඇත.

© Prof. Nalin De Silva

මේ ජනාධිපතිවරණයේ දී ජාතික බලවේග දුර්වල කිරීමට යොදා ගැණුනේ කටකතා හා මඩ ප්‍රචාර ය. එහෙත් ඒ එකක්වත් සාර්ථක වී නැති බව පැහැදිලි ය. තරගය කරට කර බවත් මහින්ද රාජපක්ෂ මහතා පරාජය වනු ඇති බවත් ප්‍රචාරය කෙරිණි. ආණ්ඩුවේ දූෂණ හේතුකොටගෙන බොහෝ ශ්‍රී ල නි පාක්ෂිකයන් ද දූෂණයෙන් තොර සරත් ෆොන්සේකාට ඡන්දය දෙනු ඇති බව ඇසෙන්නට විය. සරත් ෆොන්සේකා ඉදිරිපත් කරනු ලැබුයේ ද ඔහු "යුද්ධය" හා සම්බන්ධ වූ බැවින් ය. නැතහොත් පොදු අපේක්ෂකයා වීමට සිටියේ සරත් සිල්වා ය. විපක්ෂයට සිටි හොඳම අපේක්ෂකයා සරත් ෆොන්සේකා විය. බොහෝ දෙනා දෙදහස් පහේ දී රනිල් ගත් ප්‍රතිශතය මෙවර සරත් ෆොන්සේකා නොගත් බව පෙන්වා දෙති. එහෙත් ඔවුන් අමතක කරන කරුණ නම් "යුද්ධයට" පරිභව කළ රනිල් මෙවර ජනාධිපතිවරණයට ඉදිරිපත් වී නම් ඔහුට සිංහලයන් බහුතරය වූ මැතිවරණ බල ප්‍රදේශවලින් සියයට විසිපහක් වත් ඡන්ද නොලැබෙන බව ය. පළාත් සභා මැතිවරණවලින් පැහැදිලි වූයේ ඒ බව ය. සරත් ෆොන්සේකාට ඇටුවන් බෑ ඒ ජා පාක්ෂිකයන් හා මහා පරිමාණ රැස්වීම්වල එකම ආකාරයේ රතු සහ කොළ කොඩි වැනූ ජ වි පෙ තරුණයන් හැරුණු විට ඔහු යුද්ධයට සම්බන්ධ වූ බැවින් ඡන්දය දුන් සිංහලයෝ සුළු පිරිසක් ද වූහ. කෙසේ වෙතත් සරත් ෆොන්සේකා තරගයෙහි කරට කර සිටින බව නාගරික ශ්‍රී ල නි පාක්ෂිකයෝ ද විශ්වාස කළහ. ඇතැම්හු විශේෂයෙන් ම ජෙහාන් පෙරේරා ෆිලිප් රාජන්ස් වැනි ඉංගිරිසි පත්තරවලට ලියන අය සරත් ෆොන්සේකා දිනන බවක් ඇඟවීමට උත්සාහ කළහ. සරත් ෆොන්සේකා දිනුවහොත් බලය මාරුවීය යුත්තේ කෙසේ ද යනුවෙන් සාකච්ඡා කළ අය ද සිටියහ.

එහෙත් ඡන්දදායකයෝ මේ සියල්ල බොරු කළහ. සිංහලයන්, විශේෂයෙන් ම සිංහල බෞද්ධයන්, බහුතරය වූ ප්‍රදේශවල  මහින්ද රාජපක්ෂ මහතාට තරගයක් නැති විය. සමස්තයක් ලෙස ගත්කල සිංහල බෞද්ධයන්ගෙන් සියයට හැත්තෑවකට වඩා  මහින්ද රාජපක්ෂ මහතාට ඡන්දය දී ඇති බව දළ වශයෙන් කිව හැකි ය. අද මෙරට ඡන්දදායකයන්ගෙන් සියයට අසූවකට ආසන්න ප්‍රමාණයක් සිංහලයන් බව අමතක නොකළ යුතු ය. සරත් ෆොන්සේකා ඉදිරිපත් කෙරුණේ "යුද්ධයට" ඔහුගේ ඇති සම්බන්ධතාව නිසා ය. එමෙන් ම ඔහුට ඡන්දය දුන් පිරිසෙන් යම් ප්‍රමාණයක් "යුද්ධය" අනුමත කරති. එබැවින් ඉතා පැහැදිලි කරුණ නම් සිංහලයන්ගෙන් අති විශාල බහුතරය "යුද්ධය" අනුමත කරන බව ය. ජනාධිපතිවරණයේ දී තවත් වැදගත් කරුණක් සිදු විය. එනම් නන්දිකඩාල් කලපුවේ දී දේශපාලනික ව හා යුදමය වශයෙන් මරා දමනු ලැබූ ස්වයංනීර්ණ අයිතිය නිජභූමිය ආදී සංකල්ප නැවතත් ගොඩගැනීමට නොහැකි වන අයුරින් ආදාහනය කිරීම ය. කිසිවකුටවත් මේ සංකල්ප මරණයෙන් නැගිට්ටවිය හැකි නො වේ. මේ සංකල්ප හා දෙමළ ත්‍රස්තවාදය න්‍යායිකව පරාජය කෙරී බොහෝ කල් ගතවුවත් දේශපාලනික ව හා යුදමය වශයෙන් පරාජය කෙරුණේ (මරාදමනු ලැබුයේ) නන්දිකඩාල් කලපුවෙහි දී ය. ජනාධිපතිවරණයෙහි දී ඒ සංකල්ප ආදාහනය කෙරුණේ  දෙමළ බෙදුම්වාදය ද සමගිනි. අද අපට තවමත් දේශපාලන වශයෙන් පරාජය කිරීමට ඇත්තේ දෙමළ ජාතිවාදය පමණකි. (දෙමළ ජාතිවාදය ද න්‍යායික ව පරාජය කෙරී බොහෝ කල් ය.)

ජනාධිපතිවරණ ව්‍යාපාරයෙහි එක් අවස්ථාවක මේ සංකල්ප ගැන කතාකරමින් ජනාධිපතිතුමා කීවේ දැන් ඒ පරිච්ඡෙදය අවසන් බව ය. දෙමළ ජාතිවාදය පරාජය කිරීමේ දී බාධකයක් ලෙස ඇත්තේ සිංහලයන්ට විරුද්ධව දෙමළ ජාතිවාදය යොදාගන්නා බටහිරයන් ය. එහෙත් ඒ පරාජය කිරීමට අපට හැකි ය. මෙරට දෙමළ ජාතිවාදය ඇතිකර පෝෂණය කළෝ බටහිරයෝ ය. මෙරට දෙමළ ජනයාට දෙමළ වීම නිසා ම සිදු වී ඇති අසාධාරණයක් නැත. ඉංගිරිසි උගත් දෙමළ ජනයාට හිමි ව තිබූ වරප්‍රසාද කිහිපයක් නැතිවීම ඊනියා අසාධාරණයක් ලෙස සැලකෙයි. ප්‍රභාකරන් ඇතුළු ඉංගිරිසි නූගත් දෙමළ තරුණයන් පසු කලෙක සටන් කෙළේ මේ ඉංගිරිසි උගතුන් වෙනුවෙනි. අද ඒ ඉංගිරිසි උගත්තු බටහිර රටවල විසිරී සිටිති. අද අප කළ යුත්තේ ඉංගිරිසි නූගත් දෙමළ ජනයා මේ විසිරුණු ඉංගිරිසි උගතුන්ගෙන් හා බටහිරයන්ගෙන් මුදා ගැනීම ය. එහි දී උතුරු හා නැගෙනහිර පළාත් සංවර්ධනයට ද වඩා වැදගත් වන්නේ ඔවුන්ට මෙරට ඉතිහාසය ඉගැන්වීම ය. දෙමළ ජනයා අද නැවතත් කල්පනා කළ යුතු ය. අපේ ඉතිහාසයේ නව පරිච්ඡෙදයක් ලිවිය යුතු දිනය එළඹී ඇත. එහි දී සිංහල බෞද්ධ සංස්කෘතිය මෙරට විශේෂිත සංස්කෘතිය බව පිළිගැනීම තම සංස්කෘතික අනන්‍යතාවට පහරක් නොවන බව දෙමළ ජනයාට තේරුම් කළ යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva